# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.02.19 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/348/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු**</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - වාලච්චේන පොලිස් වසම.**

2025.02.18 වන දින උදෑසන කාලයේ වාලච්චේන පොලිස් වසමේ කිරාන් ප්‍රදේශයේ පුද්ගලයෙකුට පොල්ලකින් පහරදී ඝාතනය කර ඇති බවට වාලච්චේන පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 66 ක් වූ කිරාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ දියණිය විවාහයෙන් වෙන් වී සිය දියණිය ද සමඟ මරණකරුගේ නිවසේ පදිංචිව සිට ඇත. දියණියගේ සැමියා මාසිකව නඩත්තු ගෙවීම් සිදුකරන අතර ඔහු තම දියණිය බැලීම සඳහා 2025.02.18 උදෑසන කාලයේ මරණකරුගේ නිවසට පැමිණ ඇති අතර දරුවා ඉල්ලා ඔහු හා බිරිඳ අතර ආරවුලක් හටගෙන ඇත. එහිදී දියනියගේ පියා වන මරණකරුද ආරවුලට මැදිහත් වී ඇති අතර එහිදී දියනියගේ සැමියා විසින් ඔහුට පොල්ලකින් පහරදීමෙන් මෙම ඝාතනය සිදුකර ඇති බවට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරිරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. **අපරාධයට සම්බන්ධ වයස අවුරුදු 26 ක් වන කිරාන් ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.** වාලච්චේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - කොටහේන පොලිස් වසම.**

2025.02.18 වන දින රාත්‍රී කාලයේ කොටහේන පොලිස් වසමේ බ්ලූමැන්ඩල් රේල් පාර ප්‍රදේශයේ පුද්ගලයෙකු තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට කොටහේන පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 22 ක් වූ මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රාත්‍රී කාලයේ ලැබුණු දුරකථන ඇමතුමකින් පසුව මරණකරු තම බිරිද සමඟ බ්ලූමැන්ඩල් රේල් පාර අසලට පැමිණි අවස්ථාවේ එම ස්ථානයේ රැදී සිටි පුද්ගලයෙකු විසින් මරණකරුව වෙනත් ස්ථානයකට කැදවා ඇති අතර ඒ අවස්ථාවේ යතුරුපැදි වලින් පැමිණි පිරිසක් විසින් තියුණු ආයුධ වලින් පහරදී මෙම ඝාතනය සිදුකර පලාගොස් ඇත.
ඝාතනයට හේතුව හා මෙම ඝාතනය කවුරුන් විසින් සිදු කළේද යන්න මෙතෙක් අනාවරණය වී නොමැත. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරික්ෂණය සඳහා පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර කොටහේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2025.02.15 වන දින සවස් කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ ඩයස්වත්ත ප්‍රදේශයේදී තියුණු ආයුධ වලින් කපා කොටා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම සම්බන්ධයෙන් කළුතර අපරාධ කොට්ඨාසය මගින් විමර්ශන ආරම්භ කර තිබුණි. ඒ අනුව 2025.02.18 වන දින මෙම අපරාධයට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු කළුතර ප්‍රදේශයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරින් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන කළුතර දකුණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 32 යන වයස්වල පසුවන කළුතර දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - වරකාපොල පොලිස් වසම.

2025.02.18 වන දින සවස් කාලයේ වරකාපොල පොලිස් වසමේ කල්ලියද්ද ප්‍රදේශයෙන් ගලා බසින කුඩා ඔයේ දිය නෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලීමෙන් මියගොස් ඇති බවට වරකාපොල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ උඩගහවත්ත, පහලවැලිගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කෑගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කරඇත.

වරකාපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාම - උඩප්පුව පොලිස් වසම.

2025.02.18 වන දින උදෑසන කාලයේ උඩප්පුව පොලිස් වසමේ පල්ලිවාසල්පාඩුව ප්‍රදේශයේදී ට්‍රැක්ටරයක් පෙරළීමෙන් බරපතල තුවාල ලබා කොත්තන්තිව් රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බවට උඩප්පුව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වන පල්ලිවාසල්පාඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු පල්ලිවාසල්පාඩුව වෙරළ තීරයේ ට්‍රැක්ටර් රථයෙන් මාදැලක් අදින අවස්ථාවේ ට්‍රැක්ටර් රථය පෙරළී මෙම අනතුරු සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

උඩප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 06. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියයාම - තඹුත්තේගම පොලිස් වසම.

2025.02.19 වන දින අළුයම් කාලයේ තඹුත්තේගම පොලිස් වසමේ තඹුත්තේගම හා සෙනරත්ගම දුම්රිය ස්ථාන අතර ප්‍රදේශයේදී කොළඹ සිට අනුරාධපුර දක්වා ධාවනය වූ දුම්රියේ ගැටී පුද්ගලයකු බරපතල තුවාල ලබා තඹුත්තේගම රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බවට ලද පණිවිඩයකට අනුව තඹුත්තේගම පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරු කරගෙන නොමැති අතර වයස අවුරුදු 65 ක් පමණ වන පිරිමි පුද්ගලයෙකි.**

තඹුත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පල්ලේකැලේ පොලිස් ස්ථානය.

2025.02.18 වන දින සවස් කාලයේ පල්ලේකැලේ පොලිස් වසමේ දුම්බර බන්ධනාගාරයේදී පල්ලේකකැලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත බන්ධනාගාර නිලධාරීන්ගේ සහය ඇතිව වැටලීමක් සිදුකර මත්ද්‍රවය සන්තකයේ තබාගෙන සිටි බන්ධනාගාර නියාමකවරයෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 130, හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 140, ඇඹ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 460 හා දුම්කුඩු ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 110ක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන කෑගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පල්ලේකැලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නවගමුව පොලිස් ස්ථානය.

2025.02.18 වන දින දහවල් කාලයේ නවගමුව පොලිස් වසමේ ජයසේකරපුර ප්‍රදේශයේදී නවගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 201 මිලිග්‍රෑම් 290 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නවගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.02.18 වන දින දහවල් කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ තොටුපල පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 180 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 29 වයස්වල පසුවන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. විකිණීමට සූදානම්කර තිබූ අධි ආරක්ෂිත මුහුදු ශාක කොටස් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.

2025.02.18 වන දින උදෑසන කාලයේ දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත දිවුලපිටිය නගරයේදී වැටලීමක් සිදු කර **රුපියල් 75000/= ක මුදලකට විකිණීමට සූදානම් කර තිබූ අධි ආරක්ෂිත මුහුදු ශාක කොටස් ග්‍රෑම් 830 ක් සමග** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන දේවාලේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 11. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මිනුවන්ගොඩ පොලිස් ස්ථානය.

2025.02.18 වන දින රාත්‍රී කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ පන්සිල්ගොඩ ප්‍රදේශයේදී මිනුවන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 350 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන ඉමදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 12. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - බුලත්සිංහල පොලිස් ස්ථානය.

2025.02.18 වන දින දහවල් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ අතුර ප්‍රදේශයේදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 70 ක් වන බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 13. බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාය𝐫් බලකා මස්කෙළිය කඳවුර.

2025.02.18 වන දින සවස් කාලයේ මස්කෙළිය පොලිස් වසමේ බ්‍රව්න්ස්වික් වත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා මස්කෙළිය කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් සිව්දෙනෙකු ගැරීම් උපකරණ ද සමඟ** අත්අඩංගුවට ගෙන මස්කෙළිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25,36,37 හා 40 වයස්වල පසුවන මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මස්කෙළිය පොලීසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 14. විදේශ රටක නිෂ්පාදිත බෝ𝐫 12 වගර්යේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නාල්ල පොලිස් ස්ථානය.

2025.02.18 වන දින දහවල් කාලයේ නාල්ල පොලිස් වසමේ මහවත්ත ප්‍රදේශයේදී නාල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත බෝ𝐫 12 වගර්යේ ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන දිවුල්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

## 15. විදේශ රටක නිෂ්පාදිත බෝ𝐫 12 වගර්යේ ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පල්ලේවෙල පොලිස් ස්ථානය.

2025.02.18 වන දින දහවල් කාලයේ පල්ලේවෙල පොලිස් වසමේ කම්මල්පිටිය ප්‍රදේශයේදී පල්ලේවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 වගර්යේ ගිනි අවියක් එම උණ්ඩ 02 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වන පස්යාල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

## 16. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹුල්ල පොලිස් ස්ථානය.

2025.02.18 වන දින උදෑසන කාලයේ දඹුල්ල පොලිස් වසමේ වැවලවැව ප්‍රදේශයේදී දුඹුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 17. මාරක රිය අනතුරක් - අඟුරුවාතොට පොලිස් වසම.

2025.02.18 වන දින රාත්‍රී කාලයේ අඟුරුවාතොට පොලිස් වසමේ හොරණ මතුගම ප්‍රධාන මාගර්යේ මදුරාවල ප්‍රදේශයේදී මතුගම දෙස සිට හොරණ දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාගර්ය හරහා ගමන් කළ කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව හොරණ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක් වූ කළුතර දකුණ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හොරණ රෝහලේ ප්‍රතිකාර ලබන අතරෙ අනතුර සම්බන්ධයෙන් අඟුරුවාතොට පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 18. මාරක රිය අනතුරක් - යාපනය පොලිස් වසම.

2025.02.18 වන දින දහවල් කාලයේ යාපනය පොලිස් වසමේ ඒ 09 මාගර්යේ මාංපලම් හන්දියේදී ඒ 09 මාගර්යට සම්බන්ධ වන කනගරත්නම් පාර එස්සේ පැමිණි පා පැදියක් ඒ 09 මාගර්යට ඇතුළු කර යාපනය දෙසට ගමන් කිරීමට යාමේදී චාවකච්චේරිය දෙස සිට යාපනය දෙසට ධාවනය වූ ටිපර් රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු යාපනය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. යාපනය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**